# මගේ පුංචි බලු පැටියා



කතෘගෙ නම :
J.ධනුෂි කාවින්ද්‍යා

කෘතියෙ නම : මගේ පුංචි බලු පැටියා

කතෘගෙ නම : J.ධනුෂි කාවින්ද්‍යා

කතෘ අයිතිය ඇතුලු විස්තර:ISBN no: 978-624-208-516-6

පිටකවර සිතුවම : J.D. කාවින්ද්‍යා

4-B ශ්‍රේණිය (ප්‍රාථමික අංශය)

මහාමායා බාලිකා විදුහල

මහනුවර

පොතේ පරිගණක සැකසුම : "PRESS"

නො,24,කොටුගොඩැල්ල

වීදිය මහනුවර

කතෘගෙ වෙනත් කෘති : රකිමු පණ මෙන් පරිසරය

කෘතිය පල කරන දින : 2025/01/18

# පිදුම

❖ නව ලෝකයට පිය නගන්නට වෙර දරන පුංචි අපට

නිරතුරුවම දැනුම ලබා දෙන මාගේ ආදණීය

විදුහල්පති තුමිය ඇතුලු ගුරු මව්පියන්ටත්, පන්තිභාර

-ගුරු තුමිය ඇතුලු ගුරු මව්පියන්ටත්,

මාගේ ආදරණීය දෙමාපියන්ටත්,

මාගේ සොයුර සොයුරියන්ටත් මේ පොත ආදරයෙන්

පුද කරමි...

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දනුමෙන් යුත්
බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගන ඒවා ඔපවත් කිරීම තුලින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු
මෙන් ම පාසලේ දර්ෂනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම
කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ
අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථයකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන් ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගි ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල්තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් ගපාතක්" ව්‍යපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට ඇත්දැකීම් සමුදායක් මෙන් ම ගත්කතුවරගයකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ
ඇනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිතය මාසයට සමගාමී ව අප පාසල විසින් සිංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" වයාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු ඇත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන් ම අනගතය දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යපෘතිය වෙනුවෙන් සහය දැක් වූ ඇප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදී ශිෂයාවන් සිසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල් පතිවරුන් ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා
විද්‍යාලය - මහනුවර



මා ගමනක් යන විට පාරේ දමාගොස් සිටි පුංචි බලු පැටියකු මම දුටුවෙමි.

.



මේ පුංචි පැටියා මට ගෙදර ගෙන යාමට ආස හිතුනත් ඊට අම්මා ගෙන් අවසර නොලැබුන නිසා මම ගොඩක් දූකින් සිටියෙමි.



මම මෙසේ සිටිනවා දුටු මගේ අම්මා මේ පුංචි බලු පැටියාව ගෙදර ගෙන යාමට අවසර දුන් නිසා මට ගොඩක් සතුටු හිතුනෙමි.



මම මේ පුංචි පැටියා ගෙදර ගෙන යන විටත්,එයාගේ ඇස් දෙකවත් ඇරී නැති තරම් පුංචිය. මම එයාව නාවා හොඳින් පිසදමා කිරි පොවා මගේ චූටි මෙට්ටයේ නිදි කලෙමි.



අම්මත් නැති පුංචි පැටියට හොඳටම නින්ද ගිහින්.මගේ හිතට ලොකු සතුටක් ඇතිවුනා.



දින සති ගෙවී ගොසින් මගේ පැටියා දැන්
චුට්ටක් ලොකුයි ඇසුත් ඇරිලා.දැන් මගෙත්
එක්ක සෙල්ලම් කරන්නත් එනවා.



මම එයත් එක්ක සල්ලම් කරනවා.දුවනවා, පනිනවා, අම්මා නැති අඩුව මේ පුංචි පැටියට දැන් දැනෙන්නේ නැහැ.



මගේ පුංචි බලු පැටියා දැන් ගොඩාක් ලොකු වෙලා මේ බලන්න දැන්නම් එයා ගොඩක් සැරයි. තරහා ගියාම හපනවා.ඒ වුනත් මට ගොඩක් සතුටුයි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයෙන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔපනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි ඔවුන්ගේ සාහිත්‍ය පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන ඇමාත්‍යාංශයට ගපෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රරන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක් ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බුඳදුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට ඇත්දැකීම් සමුදායක් ලබාගදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි.මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් හා සැලසුම් කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක්සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක් ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබව යි පතමු

මෙයට
සෙනෙවිරත්න මලේකම්
පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක